# උපදෙස් පත්‍රිකාව

කොන්සියුලර් සබඳතා පිළිබඳ වියානා සම්මුතියේ 36වන වගන්තයේ ඡේද 1 බී අක්ෂරය ප්‍රකාර, ජර්මන් ෆෙඩරල් සමුහාණ්ඩුව ඔබේ අයදුම මත ඔබේ මවුරටේ කොන්සියුලර් නියෝජිත කාර්යාලය වෙත ඔබේ සිර අඩස්සිය සම්බන්ධයෙන් අප්‍රමාදව දැනුවත් කිරීමට බැඳී සිටියි. එසේ දැනුවත් කිරීම ඉෂ්ට වන්නේ උසාවිය, ජනඅභිචෝදක කාර්යාලය නැත්නම් ඔබේ සිර අඩස්සිය ක්‍රියාත්මක කරන ආයතනය මගින්ය.

එපමණක් නොව, **ඔබ අනුමතිය දෙන්නේ නම්**, ඔබේ මවුරටේ විදේශ නියෝජිතයන් වෙත ඔබේ සිර අඩස්සියට පාදක වන කරුණු කාරණා දැනුම් දීමට **පුළුවන**. එම එකඟත්වය ඕනෑම විටක අස් ගර ගැනීමට ඔබට පුළුවන.

ඔබේ කැමැත්ත නැතිව හෝ ඔබේ කැමැත්තට පටහැනිව විදේශ නියෝජිතයන් දැනුවත් කිරීම සඳහා බැඳීසිටීමට ප්‍රතිඥා දෙමින් ජර්මන් ෆෙඩරල් සමුහාණ්ඩුව සහ විවිධ රාජ්‍යයන් අතර ගිවිසුම් ඇති කර ගෙන ඇති බව වැඩි දුරටත් ඔබට පෙන්වා දෙනු ලැබේ. දැනට එබඳු ගිවිසුම් පහත දැක්වෙන රාජ්‍යයන් අතර පවතී:

**ඩොමිනිකන් ජනරජය, ෆීජි සමූහාණ්ඩුව, ග්‍රෙනාඩා, ග්‍රීසිය, ගයනා, ඉතාලිය, ජැමෙයිකාව, ලෙසෝතෝ, මලාවි, මෝල්ටාව, මොරිෂස්, මොනාකෝ, සියරා ලියොන්, ස්පාඤ්ඤය*, ශාන්ත කිට්ස් සහ නෙවිස්, ශාන්ත වින්සන්ට් සහ ග්‍රෙනඩින්ස්, ටියුනීසියාව, එක්සත් රාජධානිය හෙවත් මහා බ්‍රිතාන්‍යය සහ උතුරු අයර්ලන්තය (චැනල් දූපත්, අයිල් ඔෆ් මෑන් සහ බ්‍රිතාන්‍යයට අයිති විදේශීය ප්‍රදේශ වන ඇන්ගුයිලා, බර්මියුඩා, බ්‍රිතාන්‍ය වර්ජින් දූපත්, ෆෝක්ලන්ඩ් දූපත්, ගිබ්‍රෝල්ටාර්, කේමන් දූපත්, මොන්ට්සෙරාට්, පිට්කේන් දූපත්, ශාන්ත හෙලේනා, ඇසෙන්ෂන් සහ ට්‍රිස්ටන් ඩා කුන්හා, ටර්ක්ස් සහ කයිකොසින් ඇතුළුව) සයිප්‍රසය.**

මෙම රටවල් එකක පුරවැසිභාවය ඔබට හිමිනම්, - ඔබ කැමති නැතත් - ඔබේ සිර අඩස්සිය ගැන උසාවිය, ජනඅභිචෝදක කාර්යාලය නැත්නම් ඔබේ සිර අඩස්සිය ක්‍රියාත්මක කරන ආයතනය මගින් ඔබේ රටේ විදේශ නියෝජියන් වෙත අනිවාර්යෙන්ම දැනුවත් කරනු ඇත.

ඔබට මනාප නම්, ඔබ විසින්ම ඔබේ සිර අඩස්සිය ගැන ඔබේ රටේ නියෝජියන් දැනුවත් කිරීමට ඇත්තෙන්ම ඔබට අයිතිය ඇත. වෙනත් අන්දමේ දැන්වීම් වුවත් ඔවුන් වෙත ලැබීමට සැලැස්වීමට ඕනෑම විටක ඔබට පුළුවන.

* ඉහත දැක්වෙන දැනුවත් කිරීම් නිල බලයෙන් ඉෂ්ට කරවීමට හැකි වන්නේ, ළඟම පිහිටි ඔබේ මවුරටේ

කොන්සියුලර් කාර්යාලය වෙත ඔබ විසින්ම දැනුම් දීමට හැකි තත්ත්වයක් ඔබට නැත්නම් පමණක් බව සළකන්න.